**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක II - 2021**

---

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක II හි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව අතර 2018 මැයි 16 දිනැතිව එළඹි අංක. 8878 එල්කේ දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ණය ගිවිසුම අනුව, එවකට පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහයෝගයෙන් එවකට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතියේ විධායක සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. රටේ තෝරාගත් ප්‍රදේශවල ඉහළ අවදානම් සහිත ජන කණ්ඩායම්වල බෝ නොවන රෝග හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම අවධාරණය කරමින් ප්‍රාථමික සෞඛ්‍ය සේවාවල භාවිතය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. (අ) ප්‍රාථමික සෞඛ්‍ය සේවා ප්‍රතිසංවිධානය හා ශක්තිමත් කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම (ආ) නවෝත්පාදන ප්‍රදාන සහ ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වීම (ඇ) අවිනිශ්චිත හදිසි ප්‍රතිචාර දැක්වීම නමින් වූ කොටස් තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 697,936.86 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 4,419 ක් වන අතර ඉන් රු. මිලියන 31,588 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 200 ක් මූල්‍යායනය කිරීමට ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව එකඟවී තිබුණි. එයින් රු. මිලියන 2,368.27 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 15.00 ක් ව්‍යාපෘතියේ සංරචක - II යටතේ සිදුකිරීමට නියමිත ක්‍රියාකාරකම් සඳහා වෙන් කර තිබුණි. පසුගිය වර්ෂය තුළ මෙම සංරචකය සඳහා වෙන් කරන ලද මුදල එක්සත් ජනපද ඩොලර් මිලියන 6.00 ක් දක්වා අඩු කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2019 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට එහි කටයුතු නිම කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 මතය**

---

2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් සහ ගෙවීම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------------

**2.1** **නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

--------------------------------------------------------

| අංකය | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2013 නොවැම්බර් 29 දිනැති අංක 230/2013 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය. | චක්‍රලේඛයට අනුව ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනීකරණය කළ යුතු වුවද, අනුපිළිවෙළින් රු. මිලියන 351 ක් සහ රු. මිලියන 185 ක් වූ පොළිය සහ බැඳීම් ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | වාර්තාවේ දක්වා ඇති නිරීක්ෂණය පිළිගනිමි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීමට වහාම පියවර ගන්නා අතර 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කිරීමට තටයුතු කරනු ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව ණය ගැණුම් පිරිවැය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 | | | |
| | (i) 9.2 ඡේදය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව සාමාජිකයින් 26 දෙනෙකුගෙන් සමන්විත වුවද, රැස්වීම් සඳහා සාමාන්‍ය සහභාගීත්වය සියයට 27කට වඩා අඩු විය. | බොහෝ සාමාජිකයින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නොමැති වීම හේතුවෙන්, ආරාධනා කිරීම්, සිහිකැඳවීම් සිදු කළ ද, සහභාගීත්වය තහවුරු කර තිබුණද සහභාගීත්වය අඩු විය. | කමිටුවේ සාමාජිකයන්ගේ පැමිණීම ඉහළ නැංවීමට කටයුතු කළ යුතුයි. |
| | (ii) 9.3 ඡේදය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස් විය යුතු වුවද, වසර තුළ කමිටුව රැස්වී තිබුණේ එක් අවස්ථාවක දී පමණි. | මෙම ව්‍යාපෘතිය පළාත් මට්ටම්වලින් ක්‍රියාත්මක වන බැවින්, එම කමිටුවට බොහෝ නිලධාරීහු සම්බන්ධ වී සිටිති. එබැවින්, ගිවිසුමට අනුව, වසරකට ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් දෙකක් පැවැත්වීම සඳහා වූ විධිවිධාන ව්‍යාපෘති ඇගයුම් ලේඛනය මඟින් පැහැදිලි කෙරේ. කෙසේ වුවද, කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2019 අනුව, පළාත් සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය වශයෙන් සෑම මාස දෙකකට වරක්ම පාහේ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් පවත්වයි. | චක්‍රලේඛ උපදෙස් අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව පැවැත්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය. | ව්‍යාපෘතිය මගින් රු. මිලියන 79.76 ක වියදමින් ප්‍රසම්පාදනය කර තිබූ දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ භාණ්ඩ සමීක්ෂණය 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ පවත්වා නොතිබුණි. | මෙම භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ කමිටුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත් කර තිබුණ ද, අධික වැඩ ප්‍රමාණය හේතුවෙන් සැලසුම් කළ පරිදි භාණ්ඩ සමීක්ෂණය ආරම්භ කිරීමට කමිටුවට නොහැකි විය. කෙසේ වුවද, භාණ්ඩ සමීක්ෂණය පවත්වා අවසන් වූ පසුව වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් අනුව භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ 64 ඡේදය | මධ්‍යම රජය මට්ටමින් සහ පළාත් මට්ටමින් සෞඛ්‍ය අංශය සඳහා දරන ලද වියදම් සහ ව්‍යාපෘතියේ සංරචක-I යටතේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබිඹු කරමින් වෙනම මූල්‍ය ප්‍රකාශන තුනක් ව්‍යාපෘතිය මගින් සකස් කළ යුතු වුවද, මධ්‍යම රජය මට්ටමේ සහ සංරචක-I හි 2021 වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා ව්‍යාපෘතිය මගින් ඉදිරිපත් කර නොතිබුණි. | මෙහි සඳහන් කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම ලිපියේ දින සිට සති දෙකක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කරනු ඇත. | වෙන වෙනම මූල්‍ය ප්‍රකාශන තුනක් සකස් කර නියමිත වේලාවට විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**2.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ අනුකූලතා ලිපි වැනි ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු. මිලියන 80 ක් වටිනා ජංගම නොවන වත්කම් සහ රු. මිලියන 6 ක් වන බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුමේ ශේෂය ප්‍රමාණවත් ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. | 2021/12/31 දිනට තථ්‍ය මුදල් ශේෂය කෙටුම්පත් විගණනයේ දක්වා ඇති රු.5,938,209 ක මුදල මිස බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුමේ ශේෂය නොවේ. | මෙම තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන සඳහා ඩිජිටල් සංඥා පද්ධති 600 ක් සැපයීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2021 මැයි 07 දින බදු රහිත රු. මිලියන 77 ක කොන්ත්‍රාත්තු වටිනාකමක් යටතේ ප්‍රදානය කරන ලදී. කෙසේ වුවද, රු. මිලියන 77ක් වැය වන පද්ධති 599 ක් ඇණවුම් කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 75 ක් වැය වන පද්ධති 584 ක් පමණක් ලැබී තිබුණි. කෙසේ වුවද, ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථානවල අවශ්‍ය යටිතල පහසුකම් සුදුසු ලෙස පවතීද යන්න පිළිබඳව නිසි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර මෙම පද්ධති මිලදී ගෙන තිබීම හේතුවෙන්, ඒවා ස්ථාපනය කිරීමේදී විවිධ ගැටළු සහ බාධකවලට මුහුණ දීමට සිදු විය. 2022 මැයි 25 දිනට පද්ධති 518 ක් පමණක් ස්ථාපනය කර ක්‍රියාත්මක කර තිබුණි. | බොහෝ කළමනාකරණ හේතූන් මත සෞඛ්‍යය සඳහා කැප වූ යෝජිත Peo TV නාලිකාවක් පවත්වාගෙන යාම වෙනුවට ඩිජිටල් සංඥා පද්ධතිය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරන ලදී. 2021.05.07 දින සාර්ථක ලංසුකරු වූ M/S Abans PLC වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීම පිළිබඳ දැනුම්දීම යවන ලදී. බැංකු තුළ ක්‍රියාත්මක වන කුඩා පරිමාණ සංඥා පද්ධති කිහිපයක් හැරුණු විට, මෙය රාජ්‍ය සේවා අංශයේ නව්‍ය ක්‍රියාකාරකමක් වන බැවින්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සමගාමීව පුළුල් කරන ලද ක්‍රියාකාරකමක් වශයෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මගින් මුල් සැලසුම් සකස් කරන ලද අතර ලෝක බැංකුව විසින් මේ සඳහා අනුමැතිය ලබා දෙන ලදී. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. |